# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 16/2016

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 නොවැම්බර් මස 17වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>විශ්වවිද්‍යාල පද්ධතියේ ආචාර්යවරුන් හැර අනෙකුත් සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස</u>**

"වයස අවුරුදු 55න් ඔබ්බට සේවය දීර්ඝ කිරීම" සම්බන්ධව 2010/12/29 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 940 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. 2016 නොවැම්බර් 03වන දින පැවති සිය 952 සභා වාරයේ දී කොමිෂන් සභාව විසින් " රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වයස" මැයෙන් 2013/01/15 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013, 2016 අංක 17 දරන විශ්වවිද්‍යාල පනත (සංශෝධිත) සමඟ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

2009 අංක 57 දරන පනත මඟින් සංශෝධනය කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 75වන වගන්තිය පහත පාඨ මඟින් ප්‍රතිස්ථාපනය සහ ආදේශනය කොට ඇත.

"75. (1) රජය විසින් කලින් කලට තීරණය කරනු ඇති පරිදි රජයේ නිලධාරියකුගේ විශ්‍රාම ගැන්වීමේ වයස, රජයේ නිලධාරියකුට අදාළ වන දිනයේ සිට ම ක්‍රියාත්මක වන පරිදි ආචාර්යවරයෙකු හැරුණු කොට ඕනෑම තනතුරක් දරන්නෙකුගේ විශ්‍රාම ගැන්වීමේ වයස හා සම්බන්ධව අදාළ වනු ඇත.

(2) (අ) එම තනතුර දරන්නා අනුයුක්ත කර ඇති උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය හෝ කොමිෂන් සභාව හෝ එම පුද්ගලයා අනුයුක්ත කර ඇත්තේ උසස් අධ්‍යාපන ආයතනයකට වන අවස්ථාවකදී එම ආයතනය අනුබද්ධ කර ඇති උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින්, ආයතනයේ නිර්දේශ මත පදනම්ව අදාළ ආයතනයේ පාලන අධිකාරිය හෝ කොමිෂන් සභාව විසින් අවස්ථානෝචිත පරිදි විෂමාචාරය, අකාර්යක්ෂමතාව, හෝ රාජකාරි පැහැර හැරීම වෙනුවෙන් පවත්වනු ලබන විමර්ශනයක තීන්දුව ලැබෙන තෙක්, එම තනතුර දරන්නාගේ සේවය තාවකාලිකව අත්හිටවනු ඇත.

(ආ) එවැනි විමර්ශනයකින් පසුව, එම තනතුර දරන්නා වැරදි බවට සනාථ වුවහොත්, කොමිෂන් සභාව, එවැනි පුද්ගලයකු අනුයුක්ත උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය හෝ එම පුද්ගලයා අනුයුක්ත කර ඇත්තේ උසස් අධ්‍යාපන ආයතනයකට වන අවස්ථාවකදී එම ආයතනය අනුබද්ධ කර ඇති උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය, අවස්ථානෝචිත පරිදි, කොමිෂන් සභාව හෝ අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය මඟින් සම්මත කර ගත් තීරණ මත එම තනතුර දරන්නා අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හෝ සේවයෙන් පහ කිරීම සිදු කරනු ඇත".

ඒ අනුව, ඉහත පාඨ සමඟ පහත සඳහන් කොන්දේසි හා අනුකූලව කටයුතු කරන මෙන් සියලු උසස් අධ්‍යාපන ආයතන /ආයතන වෙතින් ඉල්ලා සිටිනු ලැබේ;

I. ආචාර්යවරුන්ගේ හැර විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයකුගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 ක් වන අතර, කෙසේ නමුත්, කිසියම් නිලධාරියකු මෙම සීමාව ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස, එනම් අවුරුදු 60 දක්වා ඔහු /ඇය සේවයේ රැඳී සිටිය හැකිය.

II. වයස අවුරුදු 55-60 දක්වා කාලපරිච්ඡේදය තුළ නිලධාරියාට ඔහුගේ /ඇයගේ අභිමතය පරිදි, කොමිෂන් සභාව /පාලන අධිකාරිය වෙත මාස 03ක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව සේවයෙන් විශ්‍රාම ගත හැකිය.

III. කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය සතුටුදායක නොවන ඕනෑම නිලධාරියකුට වයස අවුරුදු 55න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් ලබා නොදිය යුතු යැයි කොමිෂන් සභාව /පාලන අධිකාරිය තීරණය කරන්නේ නම් නිලධාරියාට තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකි වන සේ මාස 06ක පූර්ව දැනුම්දීමකින් පසුව ඔහු /ඇය සේවයෙන් විශ්‍රාම ගැන්වීමේ අධිකාරිය කොමිෂන් සභාව /පාලන අධිකාරිය සතු වේ.

මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන වහාම ක්‍රියාත්මක වනු ඇති අතර මෙම චක්‍රලේඛය ක්‍රියාවට නැංවීමත් සමඟ 2010/12/29 දිනැති කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 940 අවලංගු වනු ඇත.

කරුණාකර මෙම කරුණු අදාළ සේවකයන්ගේ අවධානයට යොමු කර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/3/13